# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2342/30 - 2023 ජූලි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47 (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6 (2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (ආ) වගන්තිය සහ 21(2)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

*(අ)* ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "මීගම්මන රජමහා විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

*(ආ)* නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "මීගම්මන රජමහා විහාර භූමි ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 ජූලි මස 21 වැනි දින,
කොළඹ දී ය.

1A - G39975— 11 (2023/07)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**මීගම්මන රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය :**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළුකොට්ඨාසයේ, අංක 601 මීගම්මන ග්‍රාම නිලධාරි වසමේ, මීගම්මන ගමෙහි පිහිටි, විහාරේවත්ත සහ පිහිල්ලේ හෝ දෙණිය කුඹුර නැමැති ඉඩමට සර්වේයර් ජනරාල්ගේ 2023 මැයි මස 10 වැනි දින දරන අංක Maha/PTD/2023/147 දරන අනුරේඛනයේ කැබලි අංක "ඒ" වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.5579 ක් (අක්. 03 රූ.03 පර්. 15.94) ක් විශාලත්වයෙන් යුක්ත පහත පරිදි මායිම් වූ ප්‍රදේශය,

*උතුරට* : අයිතිකරු සොයාගත නොහැකි කිරවනාකැටිය වත්ත, ඇළ සහ කේ. ජී. තිලංකා කුමාරි යන අයට අයත් පන්සලතැන්න වත්ත,

*නැගෙනහිරට* : කේ. ජී. චමීර ගයාන් යන අයට අයත් පන්සලතැන්න වත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය,

*දකුණට* : එච්. එම්. ආර්. බණ්ඩාර යන අයට අයත් ගබ්බල්ගොඩ වත්ත, කැබලි අංක බී, මාර්ගය සහ කැබලි අංක සී,

*බටහිරට* : කැබලි අංක සී, අයිතිකරු සොයාගත නොහැකි කිරවනාකැටිය වත්ත සහ අනුරුද්ධ මුල්ලේගම යන අයට අයත් කිරවනාකැටිය වත්ත.

EOG 07-0251

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.